Learning Resource Center
R
De Mazenod College
Kandana

මීගමුව අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2024

භූගෝල විද්‍යාව

විභාග අංකය/නම:...................................... 2024-08

9 ශ්‍රේණිය	I හා II පත්‍රය	කාලය පැය 02යි

I කොටස

❖ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(මියන්මාරය , සිලිපීනය , අන්දමන් , 30% , 60%)

1) ආසියාවට අයත් විශාල දූපතක් ලෙස .... දැක්විය හැකිය.
2) .... ආසියාවට අයත් කුඩා දූපතක් වෙයි.
3) පෘථිවියේ මුළු ගොඩබිම් ප්‍රමාණයෙන් .... ක් ආසියා මහද්වීපය නියෝජනය කරයි.
4) ලෝක ජනගහනයෙන් .... ක් ආසියා මහද්වීපය තුළ ජීවත් වේ.
5) .... නිවර්තන මෝසම් දේශගුණය පවතින රටකි.

- අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් " ✓ " ලකුණ ද, වැරදි නම් " ✗ " ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

6) හොවැංහෝ ගඟ පැසිපික් සාගරය වෙත ගලා යයි. ( )
7) ආසියාව තුළ ස්වාධීන රාජ්‍යයන් 48 ක් පිහිටා ඇත. ( )
8) ලොව වැඩිම වර්ෂාපතනයක් ඇති ප්‍රදේශය ලෙස "චෙරාපුංජි" හැඳින්වේ. ( )
9) ආසියා මහද්වීපයට මායිම් වන මහද්වීපයක් ලෙස යුරෝපා මහද්වීපය හඳුන්වාදිය හැකිය. ( )
10) නායිල් නිම්න ශිෂ්ටාචාරය, ආසියාවට අයත් ශිෂ්ටාචාරයක් නොවේ. ( )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට, දී ඇති පිළිතුරු අතුරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11) නිවර්තන වැසි වනාන්තරවල දක්නට ලැබෙන ශාකයක් වන්නේ,
   i. ඕක්
   ii. ලාවි
   iii. මැහෝගනී
   iv. චෙස්නට්

12) වෙරළබඩ තැනිතලාව, මුහුදු මට්ටමේ සිට මීටර් කොපමණ ප්‍රමාණයක් විහිදී ඇත් ද?
   i. මීටර් 30
   ii. මීටර් 300
   iii. මීටර් 45
   iv. මීටර් 400

13) පිදුරුතලාගල කඳුවැටියේ උස මීටර් .... කි.
   i. 2524
   ii. 1551
   iii. 2723
   iv. 1658

14) ශ්‍රී ලංකාවේ පිහිටි ගංගා අතුරින් දිගින් දෙවන ස්ථානය හිමිවන ගංගාව වනුයේ,

i. මහවැලි ගඟ
ii. මල්වතු ඔය
iii. යාන් ඔය
iv. දැදුරු ඔය

15) ජෛව විවිධත්වය වැඩිම වනාන්තර වර්ගය වන්නේ,

i. පහතරට වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර
ii. කටු පඳුරු හා ළඳු කැළෑ
iii. කඳුකර වියළි වනාන්තර
iv. පහතරට තෙත් වනාන්තර

- අංක 16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර "ආ" තීරුවෙන් තෝරා එම පිළිතුරට හිමි අක්ෂරය අදාළ වරහන තුළ ලියන්න.

(අ)		(ආ)
16) පිනි මුවා, හිම වලසා	( )	කෝකසොයිඩ් ජනයා ජීවත්වේ.
17) ඉන්දියාව, පාකිස්ථානය	( )	නිවර්තන මෝසම් දේශගුණය
18) ශ්‍රී ලංකාව, ඉන්දියාව	( )	ශේෂ කඳු
19) ඉන්දුනීසියා, මෙසොපොතේමියාව	( )	කේතුධර වනාන්තරවල ජීවත්වන සතුන්
20) සීගිරිය, කතරගම	( )	පැරණි ශිෂ්ඨාචාර වේ.

(ල.2x20=40)

REGISTRAR
De Mazenod College
Kandana

II කොටස

❖ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
❖ අනෙකුත් ප්‍රශ්න අතුරෙන් ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.
❖ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ප්‍රමාණය ප්‍රශ්න 05 කි.

1)



(i) රූපයෙහි දැක්වෙන සිතියමේ 1 සිට 3 දක්වා පෙන්වා ඇති, ශ්‍රී ලංකාවේ භූ විෂමතා කලාප හඳුනාගෙන නම් කරන්න. (ල.3)

(ii) එම භූ විෂමතා කලාපවල මුහුදු මට්ටමේ සිට ඇති උස පිළිවෙළින් ලියා දක්වන්න. (ල.3)

(iii) මෙහි A, B, C, D, E, F ලෙස දක්වා ඇති ප්‍රදේශ ලියා දක්වන්න. (ල.6)

(iv)
a) අංක 1 න් දක්වා ඇති කලාපයේ දක්නට ලැබෙන භූ ලක්ෂණ 03 ක් ලියා දක්වන්න. (ල.3)

b) අංක 2 න් දක්වා ඇති කලාපයේ දක්නට ලැබෙන භූ ලක්ෂණ 02 ක් ලියා දක්වන්න. (ල.2)

c) අංක 3 න් දක්වා ඇති කලාපයේ දක්නට ලැබෙන භූ ලක්ෂණ 03 ක් ලියා දක්වන්න. (ල.3)

2)

(i) යුරෝපය හා ආසියාව වෙන් කරන ප්‍රධාන කඳුවැටිය හා ගංගාව ලියා දක්වන්න. (ල.2)

(ii) ආසියා මහද්වීපයේ නිරපේක්ෂ පිහිටීම නිවැරදිව ලියා දක්වන්න. (ල.3)

(iii) ආසියා මහද්වීපයේ ඇති සුවිශේෂී භෞතික ලක්ෂණ 05 ක් නම් කරන්න. (ල.5)

3)

(i) නිවර්තන කලාපය, උතුරින් හා දකුණින් සීමා වන අක්ෂාංශ රේඛා නම් කරන්න. (ල.2)

(ii) නිවර්තන කලාපයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ 03 ක් ලියා දක්වන්න. (ල.3)

(iii)

a) සෞම්‍ය කලාපීය වනාන්තරවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ 02 ක් ලියා දක්වන්න. (ල.2)

b) වනාන්තර විනාශ වීමට බලපාන හේතුවක් විස්තර කරන්න. (ල.3)

4)

(i) පාකිස්ථානයේ ප්‍රධාන වගා සෘතු 02 නම් කරන්න. (ල.2)

(ii) ජපානයේ ප්‍රධාන මෝටර් රථ සමාගම් 03 ක් ලියා දක්වන්න. (ල.3)

(iii) සේවා මධ්‍යස්ථානයක් ලෙස ඩුබායි හී දක්නට ලැබෙන සුවිශේෂීතාව විස්තර කරන්න. (ල.5)

5)

(i) "කාලගුණය" යනු කුමක්ද? (ල.2)

(ii) ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව ව්‍යාප්තියේ වෙනස්කම්වලට බලපාන සාධක 03 ක් ලියා දක්වන්න. (ල.3)

(iii) ඉන් එකක් පිළිබඳව සැකෙවින් විස්තර කරන්න. (ල.5)

6)

(i) ශ්‍රී ලංකාවේ අඩුම හා වැඩිම ජන ඝනත්වයක් ඇති දිස්ත්‍රික්ක 02 නම් කරන්න. (ල.2)

(ii) ශ්‍රී ලංකාවේ ජන සංයුතිය කෙරෙහි බලපාන කරුණු 03 ක් ලියා දක්වන්න. (ල.3)

(iii) ජනාවාස වර්ග 03 හඳුන්වා, ඉන් එකක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ල.5)

7)

(i) ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් 02 ක් දක්වන්න. (ල.2)

(ii) ඉන් එකක් පිළිබඳව විස්තර කරන්න. (ල.3)

(iii) යටිතල පහසුකම් වර්ග 03 ක් දක්වා, ඉන් එකක් පිළිබඳව විස්තර කරන්න. (ල.5)

8)

(i) ශ්‍රී ලංකාව ආවරණය වන පරිදි 1 : 50000 පරිමාණයේ සිතියම් පත්‍ර කීයක් නිර්මාණය කර තිබේ ද? (ල.2)

(ii) 1 : 50000 භූ ලක්ෂණ සිතියමක දැක්වෙන භෞතික ලක්ෂණ 02 ක් හා මානව ලක්ෂණ 01 ක් දක්වන්න. (ල.3)

(iii) ප්‍රධාන මාර්ගය, පාසල, රෝහල, වී වගාව, තේ වගාව සම්මත වර්ණ හා සංකේත යොදා ගනිමින් ඇඳ දක්වන්න. (ල.5)

REGISTRAR
De Mazenod College
Kandana.